ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
කළමනාකරණ උද්‍යයන උපාධි පාඨමාලාව - පස්වන මට්ටම
අඛණ්ඩ ඇගයීම් - 2006
කළමනාකරණ ආර්ථික විද්‍යාව - MCU 3207

කාලය : පැය දෙකයි

දිනය: 24.09.2006 වේලාව : පෙ. ව. 10.00 - මධ්‍යහන 12.00

ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු ලියන්න.

01. ආයතනයක මූලික පරමාර්ථය කුමක්ද? ඉහත පරමාර්ථයන් ලඟා කර ගැනීම සඳහා ආර්ථික වාදය කළමනාකරණයට උපකාර කර ගත හැක්කේ කෙසේද?

(ලකුණු 25)

02. (i) මිල සහ ප්‍රමාණය අතර පවතික සම්බන්ධතාවය විදහා දැක්විය හැකි විවිධ ආකාරයන් මොනවාද? (ලකුණු 05)

(ii) ඉල්ලුම් වක්‍රය දකුණට පහතට බෑවුම් වන්නේ මන්ද? කිසියම් ආකාරයකින් ඉල්ලුම් වක්‍රය දකුණට ඉහතට බෑවුම් විය හැකිද? (ලකුණු 12)

(iii) "සාරා" සැපයුම්කරුවන්ගේ x නම් වූ නිෂ්පාදිතය සම්බන්ධ පහත සමීකරණය සලකන්න.

$$Qdx = 500 - 5p + 7py + 0.8Ad$$

මෙහි, $Qdx$ = වසරකට ඉල්ලුම් ප්‍රමාණය
$p$ = සාරා $x$ නිෂ්පාදිතයෙහි මිල
$py$ = නෙකි සමාගමේ $x$ නිෂ්පාදිතයෙහි මිල
$Ad$ = සාරා සැපයුම්කරු $x$ නිෂ්පාදිතය සඳහා වසරකට දරන ප්‍රචාරණ වියදම්

එක් එක් ස්වායත්ත විචල්‍යයන්ගේ අර්ථය පහදා දෙමින් ඉහත සමීකරණය පැහැදිලි කරන්න. (ලකුණු 08)

03. (i) නිෂ්පාදන ආයතනයකට ඉල්ලුම් පුරෝකථනය වැදගත් වන්නේ මන්දැයි පහදන්න. (ලකුණු 12)

(ii) "පූර්ණ තරගකාරී වෙළඳපල ආයතනයක් මිල ගන්නකු (Price Taker) ලෙස සැලකේ." ප්‍රස්ථාර ඇසුරින් පහදන්න. (ලකුණු 13)

04. (i) නිෂ්පාදන ශ්‍රිතය නිර්වචනය කර එය තීරණ ගැනීම කෙරෙහි උපකාරී වන්නේ කෙසේදැයි පහදන්න. (ලකුණු 13)

(ii) "මුළු නිෂ්පාදිතය යනු නිෂ්පාදන පද්ධතියක සමස්ථ නිමැවුම් ප්‍රතිඵලයයි." මුළු නිෂ්පාදිතයෙහි විශේෂිත වූ හැසිරීම ප්‍රස්ථාර ඇසුරින් පහදන්න. නිෂ්පාදිතය ශ්‍රමය මත පමණක් රදා පවතින බව අනුමාන කරන්න. $(Q = f(L))$

(ලකුණු 12)

05. (i) ආර්ථික විද්‍යාඥයන් නිෂ්පාදන සාධක වර්ග කරන්නේ කෙසේද? මෙම නිෂ්පාදන ශ්‍රිතය දීර්ග කිරීම සඳහා ඔබට එකතු කළ හැකි සාධකයන් (Inputs) මොනවාද?

(ලකුණු 05)

(ii) නිෂ්පාදන අධියරයන් (Stages of Production) ප්‍රස්ථාර ඇසුරින් පැහැදිලි කරන්න.

(ලකුණු 20)

හිමිකම් ඇවිරිණි -